බවට සැකයක් නැත. වර්තමාන සමාජය තුළ පැළඉනි වැට දෙපස සිටගෙන එකිනෙකා සමග සණ්ඩු සරුවල් කරන දරුවන් ගැන අද අප අසන්නේ සංවේගයෙන් යුතුවය. එවන් සංකීර්ණ තත්වයක් උදා වන්නට පෙර පැවති පවුල්වල එකමුතු බව හා සහෝදර ප්‍රේමය පිළිබඳ හැඟීම් උද්දීපනය වන සේ රචනා වූ අර්ථවත් මෙන්ම රසවත් වූ ද මෙම පද රචනයට වික්ටර් රත්නායක, සුනිල් එදිරිසිංහ යන විශිෂ්ට ගායකයන්ගෙන් ගායනයෙන් ලැබී ඇති ආලෝකය නොමඳය.

පවුලක් තුළ දූ පුතුන් බාල වියේදී හෝ තරුණ වියේදී හෝ වේවා, ඔවුන්ට මතු වන විවිධාකාර ප්‍රශ්න හා ගැටලුවලදී ආදරණීය පියකු ඊට ප්‍රතිචාර දක්වමින් ඒ සමගම සිය දියණියට යහගුණ පිළිබඳව අවවාදාත්මක අදහස් ද දෙන ආකාරයෙන් සිසිර අතින් ලියවුණ "සුදු දුවේ සුදූ ....." නම් වූ ගීතය මෙම ගීත එකතුවේ අරුත්බර බව මෙන්ම විවිධත්වය ද කියා පාන්නකි. කුඩා දියණියට සිය මිතුරු මිතුරියන්ගෙන් එල්ල වන උසුළු විසුළුවලදී ඇයගේ සිත සනසමින්, ඇය දිරිමත් කරවමින්, හොඳ උපදෙස් දීමට එය අවස්ථාවක් කරගන්නා පියකුගේ අගනා අදහස් මාලාවක් ගීත රචකයා මෙම ගීයට එක් කරගෙන ඇත. "සුදු දුවේ මගේ . තලෙළු වුණත් සුදුයි දුවත් . හැමදාමත් හොඳ ළමයෙක් නම් ...", "දික්තලා වගේ . උස නූණත් . උසයි දුවත් කොතන ගියත් . ඉහළ ඉඳී නම්", "දම් රකින්න ගුණ වඩන්න ඉගෙනගන්න උසස් වෙන්න . උස වෙන්නේ උසස් වුණාමයි" යනුවෙන් පද රචනය කර ඇති මෙම ගීතයෙහි විශේෂත්වය නම් මෙම ගී එකතුවෙහි ඇතුළත් සෙසු ගීවලට වඩා එහි අරුත කෙළින්ම කියවෙන අතර එමගින් බාල පරපුරට දෙන අනගි ඔවදන් රැසක් අන්තර්ගත වී තිබීමයි. පෙර සඳහන් කළ පරිදි කවර නිර්මාණ කරුවකු හෝ සිය පෞද්ගලික අත්දැකීම් පොදු අත්දැකීම් බවට පරිවර්තනය කරමින් එහි කලාත්මක අගය ද රැකෙන පරිදි නිර්මාණය කිරීමේ වැදගත්කම මෙම ගීතයෙන් ද ප්‍රකට වනු ඇත. සරිනි දිසානායකගේ මියුරු හඬ සිය ගායනයට එක් කරගනිමින් වික්ටර් රත්නායක ගායකයාණන් මෙම ගීතයෙහි ද පද පෙළට සැබවින්ම සාධාරණයක් ඉටු කර ඇති අයුරු පැහැදිලිය.




දෙමාපියන් . දරුවන් . සොයුරු සොයුරියන් අතර පවත්නා ආදරය, සෙනෙහස, ළෙන්ගතුකම කලා ලෝකය ද එළිය කරවන සේ ගීතයට නැගීමේ අපූරු දක්ෂතාවක් සහජයෙන්ම මෙන් හිමි කරගෙන ඇති සිසිර දිසානායකගේ මෙම ගී එකතුවට ඇතුළත් තවත් ගී කිහිපයක්ම සහෘද මනස තුළ ද සෞන්දර්යය මෙන්ම සෙනෙහෙබර හැඟීම් ද කුළුගන්වයි.

"උණුසුම් තුරුලේ මේ හුරු සුවඳයි . ගැවසෙන්නේ ගේ පුරාම අප්පච්චී
සුරතල් නළලේ ලේ හුරු සුවඳයි . මේ එන්නේ සැමදාම මා පුතුනේ"

පිය . පුතු සෙනෙහසේ උච්චතම, හැඟීම්බර අවස්ථාවකට මනසින් පිවිසෙන ගීත රචකයා රසික සිත් තුළ ද එවන් සංවේදී සිතුවිලි දැනවීමට සමත් වන තවත් ගීතයකි, මේ. මිනිස් සමාජය තුළ, විශේෂයෙන්ම පවුල යනු ආදරයෙන් පිරී ඉතිරී යන සහසම්බන්ධතාවලින් පිරුණු එකමුතුවකි. ඒ තුළ දයාව, සෙනෙහස මෙන්ම යුතුකම් හා වගකීම් ද අන්තර්ගත වන බව සිසිරගේ මෙවන් ගී සංකල්පනාවලින් රසිකයාට තවදුරටත් මතක් කර දෙයි. වික්ටර් රත්නායකගේ ප්‍රවීණත්වය මතු කරලන හඬට, තිසල් වංසප පාදුක්කවිදානගේගේ මිහිරි ළමා හඬ මුසු වන අයුරු මෙන්ම සංගීත නිර්මාණයෙන් ද ගීපදවල අර්ථවත් බව තවත් මතු වී එන ආකාරය ද මෙම ගීතය ශ්‍රවණය කරන රසිකයාට දැනෙනු ඇත. වචන භාවිතයේදී සිසිර දක්වන අපූරු පද සංයෝජන හැකියාව මෙන්ම විරල යෙදුම් යෝග්‍ය ලෙස ගළපාගනිමින් පෙන්වා ඇති දක්ෂතාව ද සිසිර දිසානායක ප්‍රවීණ ගීත රචකයකු බවට දෙස් දෙයි.

පිය . පුතු සබඳතා කුළුගැන්වීමේදී ඉතිහාසය ද සිහිපත් කරමින් සිය නිර්මාණ ඉදිරිපත් කිරීමට ගීත රචකයා සමත් වී ඇති ආකාරය, මෙහි ඇතුළත් වන "රාසිං දෙයියෝ ......" යන ගීතයෙන් මනාව පැහැදිලි වෙයි. ගී පද රචකයකු ලෙස සිසිර තුළ ඇති නිර්මාණ ශක්තියට පණ පොවන ඔහු සතු දැනුම හා පුළුල් අවබෝධය ද ඔහුගේ නිර්මාණ ගුණාත්මක ඉහළ අගයකින් යුතු ඒවා බවට පත් කරවයි. වර්තමාන සිංහල ගීත සාහිත්‍යය තුළ සුභාවිත ගීත සොයා ඇවිදින්නට සිදු වේ යයි සිතන, පවසන කවරකුට වුවද, එම ගමනේදී හමු වන අගනා ගී නිර්මාණ කිහිපයක් ලෙස 'සිදංගනා' ගීත සමුච්චය හඳුනාගත හැකි වනු ඇත. සිසිර දිසානායක ගී පද රචකයකු ලෙස පැමිණ ඇති දිගු ගමනේදී ඔහු එක් කරගත් වටිනා, අගනා ගීත නිර්මාණ වර්තමාන රසික පිරිසට පහසුවෙන් හඳුනාගැනීමට ද 'සිදංගනා' ගී එකතුව උපකාරී වෙයි.

ජීවිතය යනු ආදරය, සෙනෙහස සමග සුන්දර පවුල් සම්බන්ධතා බව මෙම ගීත රචකයාගේ බොහෝ නිර්මාණවලින් විශද වී ඇත. තවද, මිනිස් සිතට අවශ්‍ය, එය ඉල්ලා සිටින ආදරය, ප්‍රේමය, ස්ත්‍රී.පුරුෂ සම්බන්ධතා කෙරෙහි ද අවශ්‍ය තරම් අවධානයක් සිසිරගේ ගී පද තුළින් මතු වී පෙනෙයි. වෛද්‍ය කුසුම් සුබසිංහ සමග සිය මිහිරි හඬින් යුත් ගායනයෙන් මෙම ගීත එකතුවට සුන්දරත්වය එක් කරන වික්ටර් රත්නායකගේ තවත් ගායනයක් නම් "සොයා බලා අතු තවාලයේ . විඩා වෙලා නෙතු සැඳෑ පැයේ . ඔබේ මගේ සිත දැනී දැනී දෝ . සිනා සලා හිරු ගියා කොහේදෝ ...." යන ගීයයි. එක් අතකින් සොබා දහමේ සුන්දරත්වය ද සමග මුසු කරගනිමින් ප්‍රේමණීය දෙහදක ආශාවන් සහිත හැඟුම් බර සිතුවිලි ළයාන්විත පද මාලාවකට ගොනු කර ගන්නට ගීත රචකයා තුළ ඇති කාව්‍යමය රචනා ශක්තිය හා ප්‍රතිභාව අගය කළ යුතුය. ඒ හා සමානව රසික මනස සුන්දරත්වයෙන් පුරවා ලන තවත් ගීතයක් නම්, ශිරෝමා ප්‍රනාන්දු සමග වික්ටර් සිය ප්‍රතිභාපූර්ණ හඬ එක් කරමින් සුමියුරු ලෙස ගයන " අරවින්ද කුසුම පිපුණා . ගෝවින්ද ගී ලතාවේ ...." යන ගීයයි. මෙහිදී ද ගීත රචකයා යො දාගෙන ඇති පද මාලාව මෙන්ම ඒවායේ මනා ගැළපීම ද රසික සිත් චමත්කාරයෙන් පුරවා ලන්නට සමත් වෙයි. 'ඉල්මහ අසිරිය' නමින් සිය 'කුරුටු ගී' කෘතියට එක් කළ මනහර ගීතයක් සිසිර 'සිදංගනා' ගී සමුච්චයට ද එක් කරගෙන ඇත. "හත් දා නව දා බාගෙන වැහැපන් . හත් වෙනි ඉල් මාසේ . හත් දා තනියේ පාළුව නහපන් . හත්වෙනි පොඩි නෑනේ ..." යනුවෙන් රචනා වී ඇති මෙම මනහර ගීතය, වැව් බැඳි රටෙහි ජනවහර ඇසුරෙන් රචනා කරන ලද්දකි. තරුණයකුගේ ජීවිතයේ මතු වන පාළුව මකන්නට 'හත්වෙනි පොඩි නෑනාට' කරන ආයාචනය මෙම ගීතය තුළ සංවේදී බව මෙන්ම මියුරු බව ද කියා පායි. මෙවන් නිර්මාණාත්මක ගී එකතුවක් මගින් ගීත රචකයා සහෘද අප වෙත දායාද කර ඇත්තේ, රත්න ශ්‍රී විජේසිංහ කලාකරුවා සඳහන් කරන පරිදි පළමුව අපගේ ශ්‍රවණේන්ද්‍රියත් අනතුරුව භාවේන්ද්‍රිය හා බුද්ධීන්ද්‍රියත් ස්පර්ශ කරවන අගනා කලා නිර්මාණ දාහතරකි. සිසිර දිසානායක අතින් එදා මෙදාතුර රචනා වී ඇති ගී පද සංඛ්‍යාව සියය ඉක්මවා ඇතැයි සිතිය හැකිය. ඒ අතුරෙන් සංගීත ලෝකයේ තම වීරයා ලෙස සි සිරගේ ගෞරවයට පාත්‍ර වන ප්‍රවීණ සංගීතවේදී, ආචාර්ය වික්ටර් රත්නායක කලාකරුවාගේ සංගීත ජීවිතයේ අඩ සියවසක් සැමරෙන අවස්ථාවේදී තම නිර්මාණ අතුරෙන් වික්ටර් රත්නායකගේ ගායනයෙන් රසවත් වූ ගීත දාහතරක් ඇතුළත් කරමින්, 'සිදංගනා' නමින් ගීත සමුච්චයක් වශයෙන් සකසා එතුමා වෙත ප්‍රදානය කරමින් සිසිර දිසානායක ප්‍රකට කර ඇත්තේ මහඟු ගුණ සමුදායකි. නිර්මාණ කුසලතාව සමග කලාකරුවකුගේ යහගුණ අතිනත ගෙන ඉදිරියට යාමෙන් ඔහුගේ නිර්මාණවල මෙන්ම දක්ෂතාවෙහි ද අගය තවතවත් වැඩි වනු ඇත. තරගකාරී ලෝකයක් තුළ, මුදල් පසුපස හඹා යමින්, සංවේදී බවකින් තොරව හුදෙක් ගීත රචනයට හෝ අන් කවර කලා නිර්මාණයන්ට හෝ යොමු වන්නන් වෙත සිසිර ගෙන එන්නේ හොඳ පණිවිඩයකි.


# IMMIGRATION LAW @

Australian Immigration Law firm of the Sri Lankan Community

We are proud to have lead the way for others to follow...

**Professional Immigration Legal Services**

Legal Advice in simple to complex Immigration matters

- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals

General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas

A Team of Qualified & Experienced Lawyers & Registered Migration Agents



**Susantha Katugampala**
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

LAW INSTITUTE OF VICTORIA ACCREDITED SPECIALIST

FAIRFIELDS LAWYERS
AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory

10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041

Suite 602, Hilton Colombo Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670

info@fairfieldslawyers.com



*We Deliver Results...*